# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන ශ්‍රී ලාංකික කාන්තාවන් එයට විසඳුම් වශයෙන් යොදාගන්නා උපාය මාර්ග පිළිබඳ අධ්‍යයනයක්.

(රුවන්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ඇසුරින්)

කවුඩු ගමගේ කුමාරි දිපිකා රත්නප්‍රිය.

GS / SS / 1570 / 2002

ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා සමාජවිද්‍යා විෂයය යටතේ ඉදිරිපත් කරන පරයේෂණ නිබන්ධය.

Libary - USJP
194833

194833

# පටුන


**පිටු අංකය**

- පටුන. I- III
- වගු ප්‍රස්තාර සටහන්. IV -VI
- සංක්ෂිප්තය. 1-2
- පළමුවැනි පරිච්ඡේදය. 3-16

  හැඳින්වීම හා ක්‍රමවේදය.

  1.1 හැඳින්වීම.

  1.2 අධ්‍යයනයේ අරමුණු,

  1.3 අධ්‍යයනයේ වැදගත්කම.

  1.4 මූලාශ්‍ර හා ක්‍රමවේදය.

  1.5 අධ්‍යයනයේ සීමා හා ගැටළු.

  1.6 පරිච්ඡේදකරණය.

- දෙවැනි පරිච්ඡේදය. 28-47

  ප්‍රචණ්ඩත්වය පිළිබඳ හැඳින්වීම හා අර්ථ නිරූපණය.

- තුන්වැනි පරිච්ඡේදය. 48-97

  කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය එහි විවිධ ස්වරූපයන් හා කාලීන ප්‍රවණතා.

- සිව්වැනි පරිච්ඡේදය. 97-142

  ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩක්‍රියා වල ස්වභාවය ගොදුරුවීම සඳහා බලපාන ලද හේතු සාධක සහ මුහුණ දෙන ගැටළු.

➢ පස්වැනි පරිච්ඡේදය. 142-162

කාන්තාවන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් වැළකීම සඳහා යොදා ගන්නා උපායමාර්ග.

➢ නිගමන හා යෝජනා 163-169

➢ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය. 170-176

➢ උප ග්‍රන්ථය 1

➢ උප ග්‍රන්ථය 11

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | පළමුවැනි පරිච්ඡේදය - හැඳින්වීම හා ක්‍රමවේදය. | 3-16 |
| 2. | දෙවැනි පරිච්ඡේදය - ප්‍රචණ්ඩත්වය පිළිබඳ හැඳින්වීම හා අර්ථ නිරූපණය.. | |
| 2.1 | ප්‍රචණ්ඩත්වය අර්ථ නිරූපණය. | 28-35 |
| 2.2 | ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය හා එහි වර්ගීකරණයන්. | 36-47 |
| 3. | තුන්වැනි පරිච්ඡේදය<br>කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය එහි විවිධ ස්වරූපයන් හා කාලීන ප්‍රවණතා. | |
| 3.1 | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හැඳින්වීම. | 48-61 |
| 3.2 | ප්‍රජාව ඇසුරෙහි සිදුවන කාන්තාවන්ට එරෙහි හිංසා ක්‍රියා. | 62-71 |
| 3.3 | රජය වගකිවයුතු ප්‍රචණ්ඩ ක්‍රියා. | 72-78 |
| 3.4 | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය. | 79-96 |
| 4. | සිව්වැනි පරිච්ඡේදය.<br>ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එහෙර ගෘහස්ථ ප්‍රචණ්ඩක්‍රියා වල ස්වභාවය, ගොදුරුවීම සඳහා බලපාන ලද හේතු සාධක සහ මුහුණ දෙන ගැටළු. | |
| 4.1 | ක්ෂේත්‍රය ආශ්‍රිතව ගෘහස්ථා ප්‍රචණ්ඩ ක්‍රියා වල ස්වභාවය. | 97-116 |
| 4.2 | කාන්තාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම සඳහා බලපාන හේතු සාධක. | 117-134 |
| 4.3 | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ගොදුරුවන කාන්තාවන් මුහුණ දෙන ගැටළු. | 135-141 |
| 5. | පස්වැනි පරිච්ඡේදය.<br>කාන්තාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් වැළකීම සඳහා යොදා ගන්නා උපායමාර්ග. | 142-162 |
| 6. | නිගමන හා යෝජනා | 163-169 |
| 7. | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය. | 170-176 |
| 8. | උප ග්‍රන්ථය-1 | |
| 9. | උප ග්‍රන්ථය-11 | |

# සංක්ෂිප්තය.

වත්මන් සමාජය තුළ ප්‍රබල වශයෙන් කතා බහට ලක්වී ඇති කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඉතා කෲර හා අමානුෂික අත්දැකීමකි. අතීත ජනසමාජය තුළ කාන්තාවට ගෞරවණීය තත්ත්වයක් හිමි වුවද, සමාජය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ක්‍රමයෙන් වර්ධනය වන තත්ත්වයක් හඳුනාගත හැකිය.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩක්‍රියා අතර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වර්තමානයේ ඉතා පුළුල් ලෙස සමාජය පුරා පැතිරී පවතී. කාන්තාවන් තම ගෘහය තුළ දී ප්‍රචණ්ඩකාරී අත්දැකීම් වලට ගොදුරුවීම ඉතා අවාසනාවන්ත තත්ත්වයකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ගොඩනැගුණු හිංසා සහගත ක්‍රියාවක් ලෙස එය සැලකේ. සමහර කාන්තාවන් සම්බන්ධයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය අත්දැකීමක් බවට පත් වී ඇත. ස්වාමිපුරුෂයාගේ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන සමහර කාන්තාවෝ තමන් හිංසාවකට ගොදුරු වී ඇති බව නොසිතති. ඔවුන් සිතන්නේ එය පවුල තුළ පැවතිය යුතු තත්ත්වයක් බවයි. එසේම ජීවිත අවුල් සහගත තත්ත්වයට පත්කර ගත් කාන්තාවෝ ද අප සමාජයේ වෙති. මෙසේ කාන්තාවෝ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම නිසා කායිකව මෙන්ම මානසිකවද පීඩාවට ලක්වෙති. කාන්තාවන් සම්බන්ධයෙන් මෙම තත්ත්වය ඉතා කණගාටුදායකය. පවුල තුළ අතිශය වැදගත් කාර්යභාරයක් ඉටුකරන කාන්තාවගේ සේවය මිල කළ නොහැකිය. ජීවිත කාලය පුරාම ඇය පවුල වෙනුවෙන් වෙහෙසෙයි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන කාන්තාවන් කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන් ද පිරිහීම නිසා ඔවුන්ට නිවසේ වැඩ කටයුතු නිසියාකාරව කළ නොහැකි වනු ඇත. ඔවුන්ගේ පවුල් සංස්ථාව දෙදරා යාමට ලක්වන අතර දරුවන් ද මෙහි බලපෑමට හසුවෙති.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් මිදීම සඳහා කාන්තාවෝ විවිධ උපාය මාර්ග අනුගමනය කරති. ඔවුන් ලබන කායික පීඩනයන්ගෙන් මිදීම සඳහාත්, මානසික සහනය උදෙසාත් මෙසේ විසඳුම් සෙවීම ඉහළ මට්ටමක පවතී. මෙම විසඳුම් මාර්ග වලින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමේ අරමුණින් එසේ යොමු වුවද, එය සාර්ථක නොවන අවස්ථා ද පවතී.

2005 වර්ෂයේදී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහිව පාර්ලිමේන්තුවේ පනතක් සම්මත වී ඇත. එමඟින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කරන්නාට විරුද්ධව උසාවියේ නඩු පැවරීමේ හැකියාව ඇත. එයද කාන්තාවන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් මිදීම සඳහා යොමු විය හැකි එක් උපාය මාර්ගයකි.

මෙසේ විවිධ විසඳුම් සොයන කාන්තාවන් විවිධ දුෂ්කරතා, ගැටළු වලට මුහුණ දෙති. සමහර කාන්තාවෝ ක්ෂණික ක්‍රියාමාර්ග අනුගමනය කරති. කාන්තාවන්ට පිහිටවීම උදෙසා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලින් නොයෙකුත් සේවා සැපයීම දක්නට ලැබේ. වත්මන් සමාජයේ ප්‍රබල අවධානයක් යොමු වී ඇති පැතිකඩක් වශයෙන් සලකා, කාන්තාවන් විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට විසඳුම් ලෙස යොදාගන්නා ක්‍රමෝපායන් පිළිබඳ මෙම අධ්‍යයනයෙන් විමසීමට ලක්කර තිබේ.